# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 දෙසැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත

**එල්. ඩී.—ඕ. 52/94**

**1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**1981 අංක 17 දරන පනතේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ වෙනත් සමාන ආයතනයක නිලධරයකු විසින් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් අයුක්තියක් සිදු කිරීම පිළිබඳව වූ පැමිණිල්ලක් හෝ චෝදනාවක් ඔම්බුඩ්ස්මන්වරයා අමතා යවනු ලබන ලියවිල්ලකින් වූ සන්නිවේදනයක් මගින් ඔම්බුඩ්ස්මන්වරයා වෙත කරනු ලැබිය හැකි ය ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(3) ඔම්බුඩ්ස්මන්වරයාට (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ලැබුණු පැමිණිල්ලකින් හෝ චෝදනාවකින් රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ වෙනත් සමාන ආයතනයක නිලධරයකු විසින් මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇතැයි හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇතැයි අනාවරණය වන බව ඔම්බුඩ්ස්මන්වරයාගේ අදහස වන අවස්ථාවක, ඔහු විසින් ඒ පැමිණිල්ල හෝ චෝදනාව පිළිබඳව මේ පනතේ විධිවිධානවලට අනුකූලව සහ ඒ විධිවිධානවලට යටත්ව පරීක්ෂා කොට වාර්තා කළ යුතු අතර, ඒ පරීක්ෂා කිරීම ආරම්භ කරන ලද බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය ;

(4) ඔම්බුඩ්ස්මන්වරයාට (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ලැබුණු පැමිණිල්ලකින් හෝ චෝදනාවකින් රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ වෙනත් සමාන ආයතනයක නිලධරයකු විසින් මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇතැයි

හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇතැයි අනාවරණය නොවන බව ඔම්බුඩ්ස්මන්වරයාගේ අදහස වන අවස්ථාවක, ඔහු විසින් ඒ පැමිණිල්ල හෝ චෝදනාව පිළිබඳව පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඔහු විසින් එසේ තීරණය ගැනීමෙන් දින තිහක් ඇතුළත ඒ පැමිණිල්ල හෝ චෝදනාව පරීක්ෂා නොකිරීමට ඔහු ගත් තීරණය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට සහ එම පැමිණිල්ල හෝ චෝදනාව කළ තැනැත්තාට දැනුම් දෙනු ලැබිය යුතුය;" සහ

(3) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති පිළිවෙලින් ඒ වගන්තියේ (5) වන සහ (6) වන උප වගන්ති වශයෙන් නැවත අංක කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ඔහු විසින්" යන වචන වෙනුවට "මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට සහ පරීක්ෂණයේ විෂය කාරණය වන පැමිණිල්ල හෝ චෝදනාව කළ තැනැත්තාට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "11 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර" යන වචන සහ ඉලක්කම් වෙනුවට "10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ 11 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ඔම්බුඩ්ස්මන්වරයාගේ නිශ්චය කිරීම.

17. (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින් තමාගේ පරීක්ෂණය අවසන් කළ විට—

(අ) යම් මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ තිබේ ද නැතහොත් කඩ කරනු ලැබීමට ඉඩ තිබේ ද යන වග; නැතහොත්

(ආ) පරීක්ෂණයේ විෂය කාරණය වූ යම් තීරණයක්, නිර්දේශයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක්—

(i) නීතියට පටහැනි වූයේ ද;

(ii) සිද්ධිය පිළිබඳව හෝ නීතිය පිළිබඳව වූ වැරදීමක් මත සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පදනම් වූයේ ද;

(iii) අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී හෝ නොමනා වෙනස්කම් කිරීමක් වූයේ ද නැතහොත් අසාධාකාරයකින් සාවද්‍ය වූයේ ද;

(iv) අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී හෝ නොමනා වෙනස්කම් කිරීමක් වන්නා වූ හෝ විය හැකි, ව්‍යවහාරයකට අනුකූල වූයේ ද; නැතහොත්

(v) (අ) නොමනා කාර්යයක් සඳහා හෝ අදාළ නොවන හේතු මත හෝ අදාළ නොවන කරුණු සැලකිල්ලට ගෙන හෝ වැදගත් කරුණු සැලකිල්ලට ගැනීම පැහැර හරිමින් හෝ

(ආ) ඔම්බුඩ්ස්මන්වරයාගේ මතයට අනුව, හේතු දැක්විය යුතුව තිබියදීත්, හේතු දැක්වීමක් නොමැතිව,

අභිමතයක් ක්‍රියාත්මක කිරීමේ දී සිදු කරන ලද්දේ ද, නැතහොත් කරන ලදදේ ද;

(vi) අසාධාරණ ලෙස ප්‍රමාදවීම, උදාසීනතාව හෝ නොසැලකිල්ල නිසා සිදු වූයේ ද

යන ප්‍රශ්නය ඇතුළුව වෙනත් යම් අයුක්තියක් නිසා සිදුවී තිබේද නැතහොත් සිදු වීමට ඉඩ තිබේද යන වග

ඔම්බුඩ්ස්මන්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

(2) ඔම්බුඩ්ස්මන්වරයා විසින් තමාගේ නිශ්චය කිරීම, ඒ පිළිබඳ තමාගේ හේතු ද සමග අදාළ ආයතනයේ ප්‍රධානයා වෙත සහ දෙපාර්තමේන්තුව, රාජ්‍ය සංස්ථාව, පළාත් පාලන ආයතනය හෝ අදාළ වෙනත් ආයතනය පවරා ඇති අමාත්‍යවරයා වෙත සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ද වාර්තා කරනු ලැබිය යුතු ය;

(3) (අ) මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ වෙනත් යම් අයුක්තියක් සිදු වී ඇති බව හෝ සිදු වීමට ඉඩ ඇති බව ඔම්බුඩ්ස්මන්වරයා නිශ්චය කරන කවර හෝ අවස්ථාවක සුදුසු යයි තමා කල්පනා කරන නිර්දේශ තමාගේ වාර්තාවේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් කළ හැකි ය; තවද එවැනි අවස්ථාවක දී ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ඒ ආයතන ප්‍රධානයා විසින් ගැනීමට යෝජනා කරන යම් පියවර කිසිවක් වේ නම් ඒ පියවර නියමිත කාලසීමා

වක් ඇතුළත දන්වන ලෙස ඔම්බුඩ්ස්මන්වරයා විසින් ආයතන ප්‍රධානයාට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන වල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ඔම්බුඩ්ස්මන්වරයා විසින්—

(i) කාරණය නැවත සලකා බලන ලෙස;

(ii) නොකර හැරීම නිවැරදි කරන ලෙස;

(iii) තීරණය අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස;

(iv) ඒ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම පදනම් වූයේ යම් ව්‍යවහාරයක් මත ද, ඒ ව්‍යවහාර වෙනස් කරන ලෙස;

(v) ඒ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම පිළිබඳව හේතු දක්වන ලෙස

නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(ඇ) එසේ නියමිත කාලසීමාව ඇතුළත ප්‍රමාණවත් හෝ උචිත යයි ඔම්බුඩ්ස්මන්වරයාට පෙනී යන කිසිම ක්‍රියාමාර්ගයක් ගනු නොලැබුව හොත්, ඔම්බුඩ්ස්මන්වරයා, ආයතන ප්‍රධානයා විසින් කරන ලද යම් නිරීක්ෂණ ඇත්නම් ඒවා සලකා බැලීමෙන් පසුව, ඔහුගේ වාර්තාවේ පිට-පතක් ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. අදාළ ආයතන ප්‍රධානයා විසින් කරන ලද නිරීක්ෂණ කිසිවක් ඇත්නම් ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඒ නිරීක්ෂණවල පිට-පතක් ඒ වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

(ඈ) එසේ නියමිත කාලසීමාව ඇතුළත ප්‍රමාණවත් හෝ උචිත යයි ඔම්බුඩ්ස්මන්වරයාට පෙනී යන ක්‍රියා මාර්ගයක් ගනු ලැබුවහොත් ගනු ලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳ ප්‍රකාශයක් ද සමග ඔහුගේ වාර්තාවේ පිටපතක් ඔම්බුඩ්ස්මන්වරයා විසින් ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ ඇති සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,100 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව නිකුත්වන එක් එක් පිටපත සඳහා ඒවා ලබාගත හැකිය.